දකුණු ආසියාවේ තරුණ වෘත්තීය සමිති සාමාජිකයන් ශ්‍රී ලාංකික කම්කරුවන්ට සහයෝගීතාව පළ කරති

IndustriALL Global Union වෘත්තීය සමිති ජාත්‍යන්තරයට අනුබද්ධ දකුණු ආසියාතික වෘත්තීය සමිති සම්මේලන 25 ක තරුණ ක්‍රියාකාරීන් වන අපි, දැනට පෙර නොවූ විරූ ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින ශ්‍රී ලාංකීය කම්කරුවන්ට සහයෝගය දක්වමු.

ශ්‍රී ලංකාවේ දිග හැරෙමින් පවතින අර්බුද සහ දැනට දිනකට එක් ආහාර වේලක් පමණක් ලබා ගනිමින් ජීවත් වන සේවකයන්ගේ අවදානම පිළිබඳව අපි දැඩි කනස්සල්ලට පත්ව සිටිමු. සීඝ්‍රයෙන් ඉහළ යන උද්ධමනය, රැකියා අහිමිවීම, වැටුප් සොරකම් කිරීම, ආහාර ඇතුළු අත්‍යවශ්‍ය ද්‍රව්‍ය නොමැතිකම, රටේ තත්ත්වය ඉතා දරුණු තත්වයකට පත්කර ඇත.

තිරසාර නොවන ණය ගැනීම්, දුර්වල ලෙස සැලසුම් කරන ලද ආයෝජන, ගෙවුම් ශේෂයේ ගැටලු, දූෂිත දේශපාලන නායකයන්, ගෝලීයව තෙල් මිල ඉහළ යාම සහ වර්තමාන අර්බුදයට තුඩු දුන් COVID 19, මෙන්ම දුර්වල කම්කරු නීති, අසාධාරණ ශ්‍රම පරිචයන්, ශ්‍රම බළකාය වෘත්තීය සමිතිගතවීම වැළැක්වීම සහ ජීවත්වීමට සරිලන වැටුප් නොගෙවීම ආදී සියල්ල රටේ කම්කරු පන්තියේ භයානක තත්ත්වයට දායක වී ඇත.

සිතාගත නොහැකි අර්බුදයක් මධ්‍යයේ, දකුණු ආසියාතික රටවල කර්මාන්තශාලා පවතින ජාත්‍යන්තර වෙළඳ නාම සහ දේශීය සැපයුම්කරුවන් ඔවුන්ගේ නිෂ්පාදන කම්හල් ශ්‍රී ලංකාවෙන් වෙනත් ආසියානු රටවලට මාරු කර ඇණවුම් හරවා යවන බවට භයානක වාර්තා අපට අසන්නට ලැබේ. දකුණු ආසියාවේ කම්හල් සහිත ජාත්‍යන්තර සන්නාමයන් අත්තනෝමතික ලෙස ඇණවුම් අවලංගු කර එක් රැයකින් මිලියන සංඛ්‍යාත කම්කරුවන් රැකියා විරහිත කල COVID - 19 අර්බුදය තුළ අත්දැකීම් වලින් ඉගෙන ගනිමින්, සන්නාම සහ දේශීය සැපයුම්කරුවන් රටින් ඉවත් වන විට ශ්‍රී ලංකාවේ අපනයන අංශයේ කම්කරුවන් සාගින්නෙන් පෙළීම, විරැකියාව, අසරණභාවය සහ ඉහළ මානව පිරිවැය පිළිබඳව අපි දැඩි ලෙස කනස්සල්ලට පත්ව සිටිමු..

ඇණවුම් ඉවත් කිරීම, අවලංගු කිරීම හෝ වෙනත් රටවලට යොමු නොකරන ලෙසත්, ශ්‍රී ලංකාවේ රැකියා සඳහා ආයෝජනය කරන ලෙසත් අපි ජාත්‍යන්තර සන්නාමවලින් ඉල්ලා සිටිමු. ශ්‍රී ලංකාවේ නිෂ්පාදන කටයුතු වසා නොදමන ලෙස දේශීය සැපයුම්කරුවන්ගෙන් අපි ඉල්ලා සිටිමු.

දිවයිනේ වත්මන් ආර්ථික හා දේශපාලන අර්බුද හමුවේ ශ්‍රී ලාංකික කම්කරු පන්තිය ඔවුන්ගේ අයිතීන් නැවත ලබා ගැනීමේ අරගලයේදී අපි ඔවුන් සමග එක්ව සිටිමු.

2022 ජූනි 15